# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 සැප්තැම්බර් මස 11 වන සඳුදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.52 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණී | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා | ජගත් පී. විතාන | රවීන්ද්‍ර යසස් කුමානායක |
| අනුරාධ විමලරත්න | ජනක දීපාල් වැලිවත්ත | රවී විජේසේකර |
| අනුරුද්ධ ලේකම්ගේ | ජයන්ත ද සිල්වා | රොජර් සෙනෙවිරත්න |
| අසෝක රන්වල | ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා | රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර් |
| අශෝක දයාරත්න | ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර | රෝස් ප්‍රනාන්දු මෙනෙවිය |
| අමල් සිල්වා | තුවාන් ආමිත් මොහමඩ් අක්රම් | ලක්ෂ්මන් නිපුණ ආරච්චි |
| අර්ෂාඩ් නිසාම්ඩීන් | තෙබුවන පියනන්ද හිමි | ලයනල් ජයසිංහ |
| ඇන්ටනී උපුල් රාජිත | නව්සර් ෆව්සි | ලලන්ත ගුණසේකර |
| ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා | නිමල් ආර්. පීරිස් | ලලිත් එල්ලාවල |
| ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් | නිමල් චන්ද්‍රරත්න | ලලිත් වර්ණකුමාර |
| ඊ.ඒ. නන්දන පත්මකුමාර | නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන | ලෙනාඩ් කරුණාරත්න |
| උදාර රත්නායක | නිරෝෂන් පාදුක්ක | විජිත් ප්‍රියන්ත |
| උදේන විජේරත්න | නිරෝෂා අතුකෝරල මැතිනිය | සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය |
| උපාලි කොඩිකාර | නිශාන්ත ශ්‍රී වර්ණසිංහ | සරත් පතිරණ |
| උපාලි ගුණරත්න | නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු | සහන් ප්‍රදීප් |
| උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ | පී.ආර්.පී. අබේගුණවර්ධන | සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා |
| එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය | පී.ඩී. අබේරත්න | සුනිල් වටගල |
| එස්. කුහවරදන් | ප්‍රදීප් උඳුගොඩ | සුමිත් විජයමුණි ද සොයිසා |
| එස්.එම්. සකාවුල්ලා | ප්‍රදීප් පෙරේරා | සුසාර දිනාල් |
| ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව | බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන | සුසිල් කිඳෙල්පිටිය |
| කාමල් කුරුප්පු | මල්ෂා කුමාරණතුංග මැතිනිය | සෙනල් වෙල්ගම |
| කිත්සිරි කහටපිටිය | මහේෂ් අල්මේදා | සේනක දමයන්ත ද සිල්වා |
| කීර්ති කාරියවසම් | මංජුල ප්‍රසන්න සම්පත් | ශිරන්ත අමරසේකර |
| කුරුසාමි කලන්කාඩි තේවර් | මෙරිල් පෙරේරා | ශ්‍රීනාත් පෙරේරා |
| කේ.ඩී. අරුණ දීපාල් | මොරිස් විජේරත්න | හරිස්චන්ද්‍ර කොස්තා |
| කොලන්නගේ වජිර පෙරේරා | මොහොමඩ් ෆයිරූස් | හෙක්ටර් බෙත්මගේ |
| කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය | මොහොමඩ් ෆායිස් | |
| චන්දන ජයකොඩි | යූ.එල්.එන්.පී. උඩවෙල | |
| ජගත් අංගගේ | රජිත හපුආරච්චිගේ | |

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| ඉන්දික බණ්ඩාර | ජගත් කුමාර | රන්දීර් රොද්‍රිගෝ |
| එම්.එස්.එම්. රහීම් | මහින්ද ජයසිංහ | රොයිස් විජිත |
| ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා | මංජුල බුද්ධදාස | සලෝචන ගමගේ |

## 01. සභාපතිවරයාගේ නිවේදනය :

*"කරදියාන හා දඹුවවත්ත කසළ කළමනාකරණ ව්‍යාපෘති හා සම්බන්ධව අත්සන් කරනු ලැබ ඇති ගිවිසුම්වල පිටපත් අද දින ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා තිබෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. ලිපි ලේඛන පිළිගැන්වීම :

අතිගරු ජනාධිපතිතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමා මගින් මෙම පළාත් සභාවේ අදහස් විමසා එවා ඇති විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ඉසුර දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් සභාවට පිළිගන්වන ලදී.

## 03. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2017.09.04 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාව පිළිගන්වන ලදී.

## 04. පළාත් සභාවේ කටයුතු :

සුමිත් ලාල් මැන්දිස් - ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"ගරු සභාපතිතුමනි, අද දින සභා රැස්වීමේ වැඩ කටයුතු, පොදු කටයුතු විෂය සඳහා පමණක් සීමා විය යුතු අතර, එම වැඩ කටයුතු සඳහා රීති අංක 15(4), 57(1), 57(3), 57(4) හා 57(5) හි විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතුය."*

## 05. විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත : (පළාත් සභාවේ අදහස් විමසීම)

***ඉසුර දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.***

*"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත*

*(විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය - පනත් කෙටුම්පත.)*

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 2 අනු ව්‍යවස්ථාව අනුව මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරනු පිණිස, අතිගරු ජනාධිපතිතුමන් විසින් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත එවන ලදුව, ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම පළාත් සභාව වෙත යොමු කරන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත (විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය - පනත් කෙටුම්පත) පිළිබඳව, මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළඹෙන තීරණයන්ට අනුකූලව පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයන් අතිගරු ජනාධිපතිතුමන් වෙත වාර්තා කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවීමට ක්‍රියා කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අනතුරුව, ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් එකී පනත් කෙටුම්පත සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරන ලදී.***

***154 ඈ ඈ***

*සියලුම පළාත් සභාවලට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම එකම දිනයක පවත්වනු ලැබිය යුතු අතර, (මේ පරිච්ඡේදයේ නිශ්චිත දිනය යනුවෙන් සඳහන් කරනු ලබන) සියලුම පළාත් සභාවන්හි ඡන්දය විමසීම් දිනය මෙම විසි වන සංශෝධනය ක්‍රියාත්මක වීමෙන් පසු පළමුවන වරට පවත්වන පළාත් සභා ඡන්ද විමසීම සම්බන්ධයෙන් පමණක් වන විට එම නිශ්චිත දිනය පාර්ලිමේන්තුව තීරණය කළ යුතුය.*

*එසේ වුවද ඒ නිශ්චිත දිනය මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන විට අවසානයට සංස්ථාපනය කරන ඇති පළාත් සභාවේ ධුර කාලය ඉකුත් වන දිනට පූර්වාසන්න මාස හයක කාල සීමාව ඇතුළත දිනයක් විය යුතුය.*

*සෙසු ව්‍යවස්ථා ඉවත් විය යුතුය.*

***සංශෝධිත ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

*ගරු ඉසුර දේවප්රිය - ප්‍රධාන අමාත්‍යතුමා*
*ගරු ශ්‍රීනාත් පෙරේරා*
*ගරු රජිත රංගන හපුආරච්චි*

***පූ.භා. 10.45 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ යසපාල කෝරළගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*ගරු පූජ්‍ය තෙබුවන පියනන්ද හිමි*
*ගරු සුසිල් කිඳෙල්පිටිය*
*ගරු ජනක වැලිවත්ත*
*ගරු සුසාර දිනාල්*
*ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි*

***පූ.භා. 11.41 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ යසපාල කෝරළගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*ගරු මොරිස් විජේරත්න*
*ගරු ජගත් අංගගේ*
*ගරු එස්. කුහවර්ධන්*
*ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ*
*ගරු කීර්ති කාරියවසම්*
*ගරු ශ්‍රීනාත් ම. පෙරේරා*
*ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්*
*ගරු මොහොමඩ් ෆායිස්*
*ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ*
*ගරු සමන්මලී සකලසූරිය මැතිනිය*
*ගරු මහේෂ් අල්මේදා*
*ගරු උපාලි කොඩිකාර*

## 06. රීති අංක 09 යටතේ යෝජනාව :

ගාමිණී තිලකසිරි - ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"ගරු සභාපතිතුමනි, රීති අංක 09 ප්‍රකාරව න්‍යාය පත්‍රයේ VIII හි විෂය පිළිබඳ වැඩ කටයුතු අංක 8(5) සහ 8(6) රීතිවල විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යා යුතු ය."*

*ගරු උපාලි කොඩිකාර*
*ගරු සුමිත් විජයමුනි ද සොයිසා*

***අ.භා. 01.53 ට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා මහතා ]මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*ගරු නිරෝෂන් පාදුක්ක*
*ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා*
*ගරු සහන් ප්‍රදීප් විතාන*
*ගරු ගුණසිරි ජයනාත් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක*
*ගරු අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා*
*ගරු අනුරාධ විමලරත්න*
*ගරු ලලිත් වර්ණකුමාර*

***අ.භා. 03.01 ට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [හෙක්ටර් බෙත්මගේ මහතා ]මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*ගරු මෙරිල් පෙරේරා*
*ගරු රෝස් ප්‍රනාන්දු මෙනවිය*
*ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා (පිළිතුරු කථාව)*

***අ.භා. 03.27 ට විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය අවසන් වීමෙන් අනතුරුව, ඒ පිළිබඳව පළාත් සභාවේ එකඟතාවය විමසූ විට, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් බෙදීමක් ඉල්ලා සිටින ලදී.***

***ගරු සභාපතිතුමා විසින්, විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පත පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද සංශෝධනයන්ට යටත්ව සභාවේ එකඟතාවය විමසූ විට, එවලේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් විරෝධය පළ කරමින් විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට පමණක් ඡන්දය විමසිය යුතු බවට යෝජනා කරන ලදුව, සභාවේ ඇති වූ නොසන්සුන්තාවය මත ගරු සභාපතිතුමා විසින් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ.භා. 4.17 ට යළිත් රැස් විය.***

***ඉන් අනතුරුව, ගරු සභාපතිතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු බහුතර මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන ඇතුළත්ව විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව සභාවේ එකඟතාවය විමසූ විට යළිත් සභාවේ දැඩි නොසන්සුන්තාවයක් ඇති විය.***

***අනතුරුව ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ, බස්නාහිර පළාත් සභාව පක්ෂව 45 යි, විපක්ෂව 28 යි, වැළකුණු 04 යි යනුවෙන් බෙදුණේය.***

## 07. කල් තැබීම :

ගරු සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 04.24 ට, 2017 සැප්තැම්බර් මස 19 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.09.11
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/11
Minuts 2017.09.11- Hansard Section